# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.07 පැය 0015 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 665 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - වාලච්චේන පොලිස් වසම**

2025.04.06 වන දින උදෑසන කාලයේ වාලච්චේන පොලිස් වසමේ කේණි නගර්, නාවල් අඩි ප්‍රදේශයේදී පහරදීමකින් කාන්තාවක් මියගොස් ඇති බවට වාලච්චේන පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්නයක් ආරම්භ කරන ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වූ නාවල් අඩි ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය සිය පුත්‍රයා සමඟ ඇතිවූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් පුතා විසින් කොස්සකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට සිදුකළ විමශර්නයේදී අනාවරණය වී ඇත. පහරදීම සිදුකළ බවට සැක කෙරෙන කැඩී ගිය කොස්සක් හා පොල්ලක් පොලිස් භාරයට ගෙන ඇත.

මෙම ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 42 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇති අතර වාලච්චේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - වැල්ලම්පිටිය පොලිස් ස්ථානය.**

2025.04.06 වන දින දහවල් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ කොළොන්නාව ප්‍රදේශයේදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 ග්‍රෑම් 800 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - වීරගුල පොලිස් ස්ථානය.**

2025.04.06 වන දින උදෑසන කාලයේ වීරගුල පොලිස් වසමේ කිරිකිත්තමුල්ල ප්‍රදේශයේදී වීරගුල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 09 මිලිග්‍රෑම් 60 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන යක්කල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වීරගුල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. ගෝඩා සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.

2025.04.06 වන දින සවස් කාලයේ පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල වගුරු බිම් ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගෝඩා ලීටර් 8694 ක් (බැරල් 46 ක්) ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. ගණිකා නිවාසයක් වටලා සැකකරුවෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - මහනුවර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.

2025.04.06 වන දින දහවල් කාලයේ දවුලගල පොලිස් වසමේ ගඩලාදෙණිය ප්‍රදේශයේදී මහනුවර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නිවාඩු නිකේතනයක් තුල පවත්වාගෙන ගිය ගණිකා නිවාසක් වටලා ගණිකා නිවාසයක් කළමනාකරණය කිරීම සම්බන්ධව සැකකරුවෙකු සහ ගණිකා වෘත්තියේ යෙදීම සඳහා රැඳී සිටි සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 68 ක් වන පිළිමතලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරියන් අවුරුදු 35 සහ 48 වයස් වල පසු වන දෙවනගල හා මුරුතලාව යන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

මහනුවර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - මීගලෑව පොලිස් ස්ථානය.

2025.04.06 වන දින සවස් කාලයේ මීගලෑව පොලිස් වසමේ පොතානේගම ප්‍රදේශයේදී මීගලෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන පොතානේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගලෑව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.